# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1468 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 24/11/2023 පැය 1845

## මාධ්‍ය නිවේදනය

**ශ්‍රී ලාංකික ළමුන් මැලේසියාව හරහා වෙනත් රටවලට යැවීමේ ජාවාරමක් සම්බන්ධව - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළඳාම, ජාවාරම් විමර්ශන හා සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාසය.**

ශ්‍රී ලාංකික ළමුන් මැලේසියාව හරහා වෙනත් රටවලට යැවීමේ ජාවාරමක් සිදුවෙමින් පවතින බවට ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජෙනරාල්වරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළඳාම, ජාවාරම් විමර්ශන හා සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර ඇත.

සිදුකරන ලද විමර්ශනයේදී උතුරු නැගෙනහිර ප්‍රදේශවල පදිංචි වයස අවුරුදු 18 ට අඩු දමිළ ජාතික ළමුන් මැලේසියාව වෙත යවන බවට හඳුනාගෙන ඇත. මෙරටින් මැලේසියාවට යාම සඳහා මෙම ළමුන්ට නීත්‍යානුකූල විදේශ ගමන් බලපත්‍රයක් භාවිතා කරන බවත්, මැලේසියාවේදී ව්‍යාජ ගමන් බලපත්‍ර සකස් කර ප්‍රංශය, බ්‍රිතාන්‍ය යන රටවල් වෙත යොමු කරන බවත් අනාවරණය වී ඇත.

මෙවැනි අකාරයට මේ වන විට මෙරටින් ළමුන් 13 දෙනෙකු පමණ මැලේසියාවට පිටත්කර ඇති බවත් මේ සඳහා අතරමැදි ජාවාරම්කරුවෙකු සම්බන්ධ වී සිටින බවට ද තොරතුරු අනාවරණය වී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළඳාම, ජාවාරම් විමර්ශන හා සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**